**ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය**

**විෂයය:- මව්බස**

**කාර්ය පත්‍රිකාව :- කාර්ය පත්‍රිකා 6**

**ශ්‍රේණිය:- 4 ශ්‍රේණිය**

- පහත දැක්වෙන නිවේදනය හොඳින් කියවන්න. අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.
- (ඉගෙනුම් පල:-නිවේදනයක ඇති කරුණු ඉදිරිපත් කරයි.)

| |
|---|
| අප පාසලේ ඩෙංගු මර්දන දිනය මැයි මස 05 වන දිනට ය. දෙමව්පියන්ගේ සහභාගීත්වයෙන් ඩෙංගු මර්දන වැඩ සටහනක් පාසල තුළ ක්‍රියාත්මක කෙරේ. එදින උදේ 8.30 වන විට දෙමව්පියන් පාසලට පැමිණිය යුතු ය. එසේ පැමිණෙන විට උදැල්ලක් / විසිකැත්තක් / පිහියක් / වැනි උපකරණයක් රැගෙන ආ යුතු ය. එදින පැමිණෙන සියලු දෙනාට සංග්‍රහ කටයුතු සිදු කරනු ලබන්නේ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසිනි. මේ සඳහා පැමිණීම අනිවාර්ය බව ඔබගේ දෙමව්පියන්ට දැනුම් දෙන්න. |

1. පාසලේ ඩෙංගු මර්දන දිනය යෙදී ඇත්තේ කවරදා ද?
2. ඩෙංගු මර්දන වැඩ සටහන ක්‍රියාත්මක කරන්නේ කවුරුන්ගේ සහභාගීත්වයෙන් ද?
3. දෙමාපියන් පාසලට පැමිණිය යුත්තේ කුමන වේලාවට ද?
4. දෙමාපියන් පාසලට පැමිණෙන විට රැගෙන ආ යුත්තේ මොනවා ද?
5. එදින සංග්‍රහ කටයුතු සිදු කරනු ලබන්නේ කවුරුන් විසින් ද?

- යුගල පද , නිවැරදි අර්ථ ගැන්වීම සඳහා භාවිත කරයි.
- 3 වන ශ්‍රේණියේ දී ඔබ උගත් යුගල පද ඇසුරෙන් පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරමින් කියවන්න.

1. ගමන් -....................... 2. සිරිත් -.......................

3. අහල -....................... 4. තෑගි -.......................

5. කෑම -.......................

- එම එක් එක් යුගල පද යොදා වාක්‍ය ගොඩනගා පවසන්න.
- උදා :- මේ දිනවල ගමන් බිමන් යාම නොකළ යුතුයි.
- පහත ඡේදය හොඳින් කියවා එහි ඇති යුගල පද තෝරා ලියන්න.

ඉගෙනීමේ අගය

"පුතා මෙහාට එන්න. මේ බලන්න ඔයාගේ පොත් මේසේ හැටි.මේසේ පුරා ම **<u>පොත් පත්</u>** ,ඔය මල්ලිත් එක්ක එන්න. ඇවිත් මේ පොත් මේසෙ පිළිවෙළට අස් කරන්න". ගේ ඇතුළේ සිට අම්මා උස් හඬින් කීවාය."මේ එනවා අම්මේ"කිසිවක් නොකළ ලෙස දිනෙත්,මල්ලී සමඟ සාලයට ආවේය.

"ඕනෑ ම කෙනෙකුට කොයි තරම් **<u>ගෙවල් දොරවල්</u>** **<u>,යාන වාහන</u>** **<u>,වතු පිටි</u>** තිබුණත් වැඩක් වෙන්නෙ නැහැ.ඉගෙන ගත්ත ම තමයි සම්පූර්ණ කෙනෙක් වෙන්නේ. ඒක තේරෙන්න තව ම ඔයගොල්ලො පුංචි වැඩි යි පුතේ"තාත්තා දිනෙත්ගේ හිස අත ගාමින් කීවේ තිබෙන ආදරයට විය යුතු යැයි දිනෙත්ට සිතිණ.

"**<u>කෙළි සෙල්ලම්</u>** හැම තිස්සෙ ම ඕනෑ නැහැ.හොඳ පුතාලා වගේ අත පය සෝදා ගෙන පාඩම් වැඩ කරන්න" අම්මා කීවා ය.

පසු ව දිනෙත් මල්ලී සමඟ පාඩම් වැඩ කළේ බොහෝ සතුටිනි.

1. ගෙවල් දොරවල්
2. යාන වාහන
3. වතු පිටි
4. කෙළි සෙල්ලම්
5. පොත් පත්

මෙම යුගල පද යොදා වාක්‍ය නිර්මාණය කරන්න?

- ඔබ උගත් යුගල පද යොදා, පහත සඳහන් වාක්‍යවල හිස්තැන් පුරවන්න.

1. අපි ..............................කියවීමේ පුරුද්දක් කර ගනිමු.
2. ................................. පිරිසිදු ව තබා ගැනීම හොඳ පුරුද්දකි.
3. මේ දිනවල පාරේ ............................ තදබදය අඩුයි.
4. ............................... පිරිසිදු කර වගා කිරීමට උනන්දු වෙමු.
5. ................................... කිරීම අපේ නිරෝගී බවට හේතු වේ.

සැකසුම:-

ඩී.එම්.එන් .කේ. රත්නායක මිය

4 ශ්‍රේණිය ඩේලියා

ර/ඇඹි/ රාජකීය විද්‍යාලය

පෙර වැඩ

- පෙළ පොතේ ඇති සිහින මැවූ සිත්තරී පාඩම  හොඳින් කීහිප විටක් කියවන්න.

පසු වැඩ

- මේ පාඩමේ ඇති යුගල පද තෝරා ලියන්න.